**ස්ලින්ටෙක් ඇකඩමියේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2023 / 2024**

---

ස්ලින්ටෙක් ඇකඩමියේ 2023 හා 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයන්හි මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්වය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ අස්ථිත්ව වල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඈ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2022/2023 සහ 2023/2024 වර්ෂවලට අදාල පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්**

සමාගම විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | රු. |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 1,893,829 |
| ජංගම වත්කම් | 2,745,422 |
| | -------------- |
| **මුළු වත්කම්** | **4,639,251** |
| | ======= |

| | |
|---|---|
| ස්කන්ධය හා වගකීම් | |
| ස්කන්ධය | (8,642,380) |
| වගකීම් | |
| ජංගම නොවන බැරකම් | 12,238,255 |
| ජංගම බැරකම් | 1,043,376 |
| | ------------ |
| **මුළු වගකීම් හා ස්කන්ධය** | **4,639,251** |
| | ======== |
| මුළු ආදායම | 57,170 |
| මුළු වියදම | 385,028 |
| | ------------ |
| **ඌණතාවය** | **(327,858)** |
| | ======== |

## 2.3 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ලින්ටෙක් ඇකඩමිය 2020 වර්ෂයේදී භාර අරමුදලකින් රු.10,500,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර 2024 මාර්තු 31 දිනය වන විටත් එම ණය ආපසු ගෙවා නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | ගෙවිය යුතු ණය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3 වෙනත් නිරීක්ෂණ

## 3.1 ස්ථාවර වත්කම් පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇකඩමියට අයත් එකතුව රු.774,490 ක් වූ ලැප් ටොප් පරිගණක 02 ක් , පුටු 07 ක්, ලිපිගොනු අල්මාරි 01 හා ඡායා පිටපත් යන්ත්‍රයක් ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය විසින් භාවිතා කරමින් පැවතුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | ඇකඩමියට අයත් වත්කම් විධිමත් අධිකාරි බලයකින් තොරව භාවිතයට බාහිර පාර්ශව වෙත ලබා නොදිය යුතුය. |
| ආ) | 2024 ජනවාරි 18 වන දින විගණනය විසින් සිදුකළ භෞතික පරීක්ෂාවේ දී ඇකඩමිය ලැප්ටොප් පරිගණක 25න් 19ක් හා පරිගණක | පිළිතුරු සපයා නොතිබුණි. | වත්කම් පැවැත්ම හා භාවිතය නිසි පරිදි කළමණාකරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2ක් ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය වෙත ලබාදී තිබුණි. පරිගණක 03 ක් සිසුන් විසින් ආපසු භාරදී නොතිබුණි.<br>ඇකඩමිය භාරයේ පුස්තකාල පොත් 30 ක් පැවති ද භෞතික පරීක්ෂාවේ දී පොත් 15ක් පමණක් පැවතුණි. | | |
| (ඇ) | ඇකඩමිය පවත්වාගෙන යන ලේඛන වලට අනුව සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති නමුත් තවමත් භාවිතයේ පවතින රු. 1,826,963 ක් වටිනා වත්කම් වල ඵලදායී ආයු කාලය නැවත තක්සේරු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි | භාවිතා කරන වත්කම්වල වටිනාකම නිසි පරිදි ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) සාංගමික සංස්ථා පත්‍රයේ 5(1) වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 09 දෙනෙකුට නොඅඩු 12 දෙනෙකුට නොවැඩි විය යුතු වුවත් 2024 මැයි වන විට එහි සංයුතිය 06 ක් විය. | පිළිතුරු සපයා නොතිබුණි. | සාංගමික සංස්ථා පත්‍රයේ 5 (1) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර තිබිය යුතුය. |
| (ආ) සාංගමික සංස්ථා පත්‍රයේ 11(1) වගන්තිය | පෙර වර්ෂයේ වාර්ෂික මහා සභාව පවත්වා මාස 15 ක් ඉක්මවීමට පෙර වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු වුවද අවසන් රැස්වීම පවත්වා මාස 20 ක් ගතවී ඇතත් නැවත මහා සභා රැස්වීමක් පවත්වා නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | සාංගමික සංස්ථා පත්‍රයේ 11 (1) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

**3.3 කළමණාකරන අකාර්යක්ෂමතා**

| | | |
|---|---|---|
| ඇකඩමියේ 2021/2022 මූල්‍ය වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන වාර්තා මඟින් මුළු වත්කම් ඉක්ම වූ මුළු වගකීම් රු.8,642,380ක් වීමෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවදානමක් පවතින බව වාර්තා කර තිබුණි. ඇකඩමිය පවත්වා තිබුණු ලේඛනවලට අනුව 2024 ජනවාරි 18 වන දිනට මුළු වගකීම් රු.12,128,239 ක් හා මුළු වත්කම් රු.3,268,316 ක් වූ බැවින් මුළු වත්කම් ඉක්ම වූ මුළු වගකීම් ප්‍රමාණය රු.8,859,923 ක් විය. ඒ අනුව අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවදානම තවදුරටත් වර්ධනය වී තිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානය යොමුකළ යුතුය. |

**3.4 ආයතනයේ කාර්යභාරය ඉටුකිරිම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇකඩමිය 2019 පෙබරවාරි මාසයෙන් පසුව සිසුන් බඳවාගෙන නොතිබුණු අතර 2024 වර්ෂය වන විට කිසිදු ක්‍රියාකාරි ශිෂ්‍යයකු ඇකඩමියේ නොවීය. තවද කිසිදු මෙහෙයුම් කටයුත්තක් සමාගම තුල සිදුකර නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | සමාගම පිහිටුවීමට අදාල කාර්යභාරය ඉටු කිරීමට නොහැකි වන්නේ නම් ආයතනය ඉදිරියට පවත්වාගෙනයාම පිළිබඳ නැවත සලකා බැලිය යුතුය. |
| (ආ) | 2017 අගෝස්තු 16 දිනැති අංක 2032/23 දරන ගැසට් නිවේදනයට අනුව උසස් අධ්‍යාපනය දියුණු කිරීමේ කාර්යය සඳහා උපාධි ප්‍රධානය කිරීමේ ආයතනයක් ලෙස ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය පිළිගෙන තිබියදී එම ආයතනයේ පූර්ණ සහය වීම මත ශ්‍රී ලංකාව තුළ නැනෝ සහ උසස් තාක්ෂණය පිළිබඳව උපාධි ප්‍රදානය සඳහා 2017 ඔක්තෝබර් 23 දින ස්ලින්ටෙක් ඇකඩමිය (ඇපයෙන් සීමිත) නමින් වෙනමම ආයතනයක් ලෙස සංස්ථාපනය කර තිබුණි.ඇකඩමිය විසින් ආරම්භ කර තිබූ උපාධි පාඨමාලා දෙක ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය මඟින් ප්‍රදානය කළ හැකි බැවින් ස්ලින්ටෙක් ඇකඩමිය නමින් උපාධි ප්‍රදානය කිරීමට 2017 වර්ෂයේදී රු.මිලියන 19 ක් රජය මඟින් ආයෝජනය කර වෙනමම ආයතනයක් පිහිටුවීම හා නඩත්තු කිරීම ඵලදායී නොවන කටයුත්තක් විය. | පිළිතුරු සපයා නොතිබුණි. | ආයතනය පවත්වා ගෙන යාම තුළින් ඵලදායී අගය එකතු වීමක් ජාතික ආර්ථිකයට සිදු නොවන බැවින් ආයතනය තවදුරට පවත්වා ගැනීම පිළිබඳ නැවත සලකා බැලිය යුතුය. |